# ඇබෑර්තු

වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා
සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය

ශ්‍රී ලංකාවේ විශාලතම රජය සතු සිල්ලර වෙළඳ ව්‍යාපාරය ලෙස, දිවයින පුරා සිටින ප්‍රජාවන්ගේ දෛනික ජීවිතය යහපත් කරමින්, ගුණාත්මක නිෂ්පාදන සහතදායී මිල ගණන් යටතේ ලබා දීමට අප කැපවී සිටිමු. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට (SMEs) ඔවුන්ගේ ව්‍යාපාර වර්ධනය කර ගැනීම සඳහා විශ්වාසදායක සහ කරදරයකින් තොර වේදිකාවක් සපයන අතරම, අවම බාධක මධ්‍යයේ ගොවීන් සහ වෙළඳුන් අතර ශක්තිමත් සහ සෘජු සබඳතා ගොඩනැගීමට අප ආඩම්බරයෙන් සහය වෙමු. අඛණ්ඩතාව, විනිවිදභාවය සහ ගෞරවය පෙරදැරි කරගනිමින්, අපගේ සේවකයින්ට සහ සියලුම පාර්ශවකරුවන්ට එක්ව වර්ධනය වීමට සහ සාර්ථක වීමට ශක්තියක් ලබා දෙන ගතික සහ සහයෝගී සංස්කෘතියක් අපි පෝෂණය කරමු.

ප්‍රජාවන්ට සේවය කිරීම, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට සහය වීම සහ ශ්‍රී ලංකාව පුරා වර්ධනයක් ඇති කිරීමේ අපගේ මෙහෙවරට දායක වීම සඳහා ඉහත සඳහන් තනතුරු සඳහා ලංකා සතොස ලිමිටඩ් ආයතනය සමග සම්බන්ධ වීමට දක්ෂ පුද්ගලයන් අප සොයමින් සිටිමු.

## 01. කළමනාකරු - මානව සම්පත් (විනය කළමනාකරණය හා කාර්මික සබඳතා)

### රැකියා විස්තරය

- කම්කරු නීති සහ සමාගම් ප්‍රතිපත්තිවලට අනුකූලව, විනය ක්‍රියාමාර්ග, අභ්‍යන්තර පරීක්ෂණ සහ සේවක විෂමාචාර ඇතුළු සියලුම කාර්මික සබඳතා කටයුතු මෙහෙයවීම.
- අදාළ අවස්ථාවලදී අලාභ අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ඇතුළුව, තොග අඩුමාන, මූල්‍ය අලාභ, නොසැලකිලිමත්කම සහ සේවක වගවීම සම්බන්ධ විමර්ශන සහ විනය ක්‍රියාමාර්ග මෙහෙයවීම.
- විනය කළමනාකරණය සහ රැකියා සම්බන්ධතා සම්බන්ධ කරුණු වලදී කම්කරු අධිකාරීන්, උසාවි සහ අනෙකුත් ව්‍යවස්ථාපිත ආයතන ඉදිරියේ සමාගම නියෝජනය කිරීම.
- කම්කරු නීති හා සමාගම් ප්‍රතිපත්තිවලට අනුකූලව මානව සම්පත් හා නීතිමය ලේඛන සකස් කිරීම සහ සමාලෝචනය කිරීම, යහපත් සේවක සබඳතා පවත්වාගෙන යාම සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා දායක වීම.

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන් සඳහා: පහත 1 හෝ 2**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (U.G.C.) විසින් පිළිගත් මානව සම්පත් කළමනාකරණය/ රාජ්‍ය පරිපාලනය/ රාජ්‍ය කළමනාකරණය හෝ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ප්‍රථම උපාධියක් සහ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ වසර 01 ක පශ්චාත් සුදුසුකම් සේවා පළපුරුද්ද.
2. ඕනෑම පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක මානව සම්පත් කළමනාකරණය පිළිබඳ වෘත්තීය සුදුසුකමක් (අන්තර් මධ්‍ය මට්ටම) සම්පූර්ණ කර තිබීම සහ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ වසර 01 ක පශ්චාත් සුදුසුකම් සේවා පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා (පහත I හෝ II) :**

I. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා තිබීම.
II. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ සහකාර කළමනාකාරිත්ව මට්ටමේ (JM) වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

- විනය කළමනාකරණය සම්බන්ඳව පෙර පළපරුද්දක් තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ

**වයස :** අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් කේතය සහ පරිමාණය :** (වැටුප් කේතය MM 1-1 2025 සහ වැටුප් පරිමාණය රු. 91,690/= (10 X රු.2,480/= - 15 X රු.3,450/= - රු.168,240/=)

**වැටුප් සහ අනෙකුත් දීමනා 2026 :** මූලික වැටුප: රු. 81,710.00, ජීවන වියදම් දීමනාව: රු. 17,800.00, වෘත්තීය දීමනාව: රු. 25,000.00, ප්‍රවාහන දීමනාව: රු. 25,000.00, සන්නිවේදන දීමනාව: රු. 1,500.00

**පත්වීමේ ස්වභාවය :** EPF සහ ETF හිමිකම් සහිත ස්ථිර පදනම මත.

## 2. කළමනාකරු - ප්‍රසම්පාදන

### රැකියා විස්තරය

- භාණ්ඩ හා සේවා නියමිත වේලාවට සහ පිරිවැය-කාර්යක්ෂම ලෙස ලබා ගැනීම සහතික කිරීම සඳහා ඵලදායී ප්‍රසම්පාදන උපාය මාර්ග සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- හොඳම මිල සහ ගුණාත්මක ප්‍රමිතීන් සහතික කිරීම සඳහා සැපයුම්කරුවන් තේරීම, ඇගයීම සහ කොන්ත්‍රාත් සාකච්ඡා කළමනාකරණය කිරීම.
- සමාගම් ප්‍රතිපත්ති, රජයේ රෙගුලාසි සහ විගණන අවශ්‍යතාවලට අනුකූල වීම සහතික කරමින් ආරම්භයේ සිට අවසානය දක්වා සමස්ත ප්‍රසම්පාදන කටයුතු අධීක්ෂණය කිරීම.
- සැපයුම් දාමය පුරා අවශ්‍යතා තක්සේරු කිරීමට සහ ප්‍රශස්ත තොග මට්ටම් පවත්වා ගැනීමට අභ්‍යන්තර දෙපාර්තමේන්තු සමග සම්බන්ධීකරණය කිරීම.
- ප්‍රසම්පාදන කාර්ය සාධනය නිරීක්ෂණය කිරීම, පිරිවැය පාලනය කිරීම සහ ක්‍රියාවලි වැඩිදියුණු කිරීම් සහ ඉතිරිකිරීම් සඳහා වන අවස්ථා හඳුනා ගැනීම.

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන් සඳහා : පහත 1 හෝ 2**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අලෙවිකරණය/ ව්‍යාපාර කළමනාකරණය/ වාණිජ/ සැපයුම් සහ ද්‍රව්‍ය කළමනාකරණය/ මිලදී ගැනීම් සහ ද්‍රව්‍ය කළමනාකරණය/ ජාත්‍යන්තර වෙළඳාම/ ව්‍යාපාර පරිපාලනය/ ප්‍රවාහන හා සැපයුම් දාම කළමනාකරණය (Logistics Management) පිළිබඳ ප්‍රථම උපාධියක් සහ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ වසර 01 ක පශ්චාත් සුදුසුකම් සේවා පළපුරුද්ද.
2. ඕනෑම පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක මානව සම්පත් කළමනාකරණය පිළිබඳ වෘත්තීය සුදුසුකමක් (අන්තර් මධ්‍ය මට්ටම) සම්පූර්ණ කර තිබීම සහ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ වසර 01 ක පශ්චාත් සුදුසුකම් සේවා පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා (පහත I හෝ II):**

I. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.
II. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ සහකාර කළමනාකාරිත්ව මට්ටමේ (JM) වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස :** අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් කේතය සහ පරිමාණය :** (වැටුප් කේතය MM 1-1 2025 සහ වැටුප් පරිමාණය රු. 91,690/= (10 X රු.2,480/= - 15 X රු.3,450/= - රු.168,240/=)

**වැටුප් සහ අනෙකුත් දීමනා 2026 :** මූලික වැටුප: රු. 81,710.00, ජීවන වියදම් දීමනාව: රු. 17,800.00, වෘත්තීය දීමනාව: රු. 25,000.00, ප්‍රවාහන දීමනාව: රු. 25,000.00, සන්නිවේදන දීමනාව: රු. 1,500.00

**පත්වීමේ ස්වභාවය :** EPF සහ ETF හිමිකම් සහිත ස්ථිර පදනම මත.

## 3. කළමනාකරු - තොරතුරු තාක්ෂණ

### රැකියා විස්තරය

- සුමට, ආරක්ෂිත සහ බාධාවකින් තොර ව්‍යාපාරික කාර්යයන් සහතික කිරීම සඳහා සමස්ත තොරතුරු තාක්ෂණ (IT) මෙහෙයුම් මෙහෙයවීම සහ කළමනාකරණය කිරීම.
- කාර්ය සාධනය සහ දත්ත ආරක්ෂාව පවත්වා ගැනීම සඳහා ජාල , පද්ධති , දත්ත සමුදායන් සහ සයිබර් ආරක්ෂණය ඇතුළු තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් අධීක්ෂණය කිරීම.
- මෙහෙයුම් කාර්යක්ෂමතාවයට සහාය වීම සඳහා ERP පද්ධති, සිල්ලර වෙළඳ යෙදවුම් සහ අනෙකුත් තීරණාත්මක ව්‍යාපාරික මෘදුකාංග කළමනාකරණය කිරීම.
- ඩිජිටල් පරිවර්තන මුලපිරීම් සහ අඛණ්ඩ තාක්ෂණික වැඩිදියුණු කිරීම් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- තොරතුරු තාක්ෂණ සහය සේවා, සැපයුම්කරුවන් කළමනාකරණය , ප්‍රසම්පාදන සහ තොරතුරු තාක්ෂණ අයවැය සැලසුම් කිරීම් සම්බන්ධීකරණය කිරීම.
- ආයතනය පුරා තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි සහ අනුකූලතා ප්‍රමිතීන් සංවර්ධනය කිරීම සහ බලාත්මක කිරීම.
- ඉහළ කාර්ය සාධනයක් සහ විශිෂ්ට සේවාවක් සහතික කිරීම සඳහා තොරතුරු තාක්ෂණ කණ්ඩායම මෙහෙයවීම, උපදෙස් දීම සහ සංවර්ධනය කිරීම.

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන් සඳහා: පහත 1 හෝ 2**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් තොරතුරු තාක්ෂණ / පරිගණක විද්‍යාව / කළමනාකරණ තොරතුරු පද්ධති (MIS) පිළිබඳ ප්‍රථම උපාධියක් සහ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ වසර 01 ක පශ්චාත් සුදුසුකම් සේවා පළපුරුද්ද.
2. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද, ජාතික වෘත්තීය සුදුසුකම් 7 වන මට්ටමට (NVQ Level 7) නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම සහ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ වසර 01 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා (පහත I හෝ II) :**

I. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.
II. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ සහකාර කළමනාකාරිත්ව මට්ටමේ (JM) වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස :** අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් කේතය සහ පරිමාණය :** (වැටුප් කේතය MM 1-1 2025 සහ වැටුප් පරිමාණය රු. 91,690/= (10 X රු.2,480/= - 15 X රු.3,450/= - රු.168,240/=)

**වැටුප් සහ අනෙකුත් දීමනා 2026 :** මූලික වැටුප: රු. 81,710.00, ජීවන වියදම් දීමනාව: රු. 17,800.00, වෘත්තීය දීමනාව: රු. 25,000.00, ප්‍රවාහන දීමනාව: රු. 25,000.00, සන්නිවේදන දීමනාව: රු. 1,500.00

**පත්වීමේ ස්වභාවය :** EPF සහ ETF හිමිකම් සහිත ස්ථිර පදනම මත.

## 04. සහකාර කළමනාකරු - තොරතුරු තාක්ෂණ

### රැකියා විස්තරය

- ආයතනය පුරා සුමට පද්ධති කාර්ය සාධනය, ස්ථාවරත්වය සහ අවම අක්‍රිය කාලය සහතික කිරීම සඳහා දෛනික තොරතුරු තාක්ෂණ මෙහෙයුම් අධීක්ෂණය කිරීම.
- ආරක්ෂාව සහ කාර්යක්ෂමතාව කෙරෙහි අවධානය යොමු කරමින් ජාල, සේවාදායක (servers), දත්ත සමුදායන්, ERP පද්ධති සහ ව්‍යාපාරික යෙදවුම් ඇතුළු තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් කළමනාකරණය කිරීම.
- ව්‍යාපාරික අවශ්‍යතාවලට අනුකූලව තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති, පද්ධති වැඩිදියුණු කිරීම් සහ ඩිජිටල් පරිවර්තන මුලපිරීම් සඳහා සහාය වීම සහ ක්‍රියාත්මක කිරීම.
- තොරතුරු තාක්ෂණ සහය සේවා, සැපයුම්කරුවන් කළමනාකරණය, ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධීකරණය කිරීම සහ තොරතුරු තාක්ෂණ අයවැය නිරීක්ෂණයට සහාය වීම.
- ඵලදායී සේවා සැපයීමක් සහතික කිරීම සඳහා තොරතුරු තාක්ෂණ සහය කාර්ය මණ්ඩලය අධීක්ෂණය සහ මෙහෙයවීම සිදු කරන අතරම, තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්ති සහ අනුකූලතා ප්‍රමිතීන් බලාත්මක කිරීම.

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන් සඳහා: පහත 1 හෝ 2 හෝ 3 හෝ 4**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් තොරතුරු තාක්ෂණ / පරිගණක විද්‍යාව/ කළමනාකරණ තොරතුරු පද්ධති (MIS) පිළිබඳ ප්‍රථම උපාධියක් .
2. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද, ජාතික වෘත්තීය සුදුසුකම් 7 වන මට්ටමට (NVQ Level 7) නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.
3. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද, ජාතික වෘත්තීය සුදුසුකම් 6 වන මට්ටමට (NVQ Level 6) නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම සහ සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර 5 ක සේවා පළපුරුද්දක් තිබීම.
4. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද, ජාතික වෘත්තීය සුදුසුකම් 5 වන මට්ටමට (NVQ Level 5) නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම සහ සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර 10 ක සේවා පළපුරුද්දක් තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා (පහත I හෝ II හෝ III) :**

I. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.
II. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ MA-4 / MA–3 කාණ්ඩයේ තනතුරක වසර 5 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
III. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ MA 1-2 කාණ්ඩයේ II ශ්‍රේණියේ තනතුරක වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස :** අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් කේතය සහ පරිමාණය :** (වැටුප් කේතය JM 1-1-2025 සහ වැටුප් පරිමාණය රු. 72,650/= - 10 X රු.1,360/= - 18 X රු.2,040/= - රු.122,970/=)

**වැටුප් සහ අනෙකුත් දීමනා 2026 :** මූලික වැටුප: රු. 65,633.00, ජීවන වියදම් දීමනාව: රු. 17,800.00, ගමන් දීමනාව: රු. 10,000.00, සන්නිවේදන දීමනාව: රු. 1,125.00

**පත්වීමේ ස්වභාවය :** EPF සහ ETF හිමිකම් සහිත ස්ථිර පදනම මත.

## 05. සහකාර කළමනාකරු - අභ්‍යන්තර විගණන

### රැකියා විස්තරය

- අභ්‍යන්තර පාලනයන්, සමාගම් ප්‍රතිපත්ති සහ නියාමන අවශ්‍යතාවලට අනුකූල වීම සහතික කිරීම සඳහා අලෙවිසැල් සහ ගබඩාවල නිතිපතා සහ හදිසි විගණන පැවැත්වීම.
- නිරවද්‍යතාවය, අඛණ්ඩතාවය සහ අක්‍රමිකතා හෝ වංචා හඳුනා ගැනීම සහතික කිරීම සඳහා මූල්‍ය වාර්තා, ගනුදෙනු, මුදල් පරිහරණය සහ තොග කළමනාකරණය සමාලෝචනය කිරීම.
- ක්‍රමවත් සහ අවදානම් මත පදනම් වූ විගණන ප්‍රවේශයක් සහතික කිරීම සඳහා ව්‍යූහගත විගණන සැලසුම් සංවර්ධනය කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට සහාය වීම.
- සොයාගැනීම්, නිගමන සහ ක්‍රියාත්මක කළ හැකි නිර්දේශයන් සහිත පැහැදිලි විගණන වාර්තා සකස් කර කළමනාකාරිත්වයට ඉදිරිපත් කිරීම.
- අභ්‍යන්තර විගණන ප්‍රමිතීන් සහ ක්‍රියා පටිපාටිවලට අනුකූලව විගණන කටයුතු, සාක්ෂි සහ සොයාගැනීම් නිසි ලෙස ලේඛනගත කිරීම සහතික කිරීම.

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන් සඳහා: පහත 1 හෝ 2**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මූල්‍ය කළමනාකරණය/ ගණකාධිකරණය/ ව්‍යාපාර පරිපාලනය හෝ වාණිජ පිළිබඳ ප්‍රථම උපාධියක්.
2. තනතුරට අදාළ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක අන්තර් මධ්‍ය සහතිකය සම්පූර්ණ කර තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා (පහත I හෝ II හෝ III):**

I. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.
II. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ MA-4 / MA - 3 කාණ්ඩයේ තනතුරක වසර 5 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
III. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ MA 1-2 කාණ්ඩයේ II ශ්‍රේණියේ තනතුරක වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස :** අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් කේතය සහ පරිමාණය :** (වැටුප් කේතය JM 1-1-2025 සහ වැටුප් පරිමාණය රු. 72,650/= - 10Xරු.1,360/= - 18 X රු.2,040/= - රු.122,970/=)

**වැටුප් සහ අනෙකුත් දීමනා 2026 :** මූලික වැටුප: රු. 65,633.00, ජීවන වියදම් දීමනාව: රු. 17,800.00, ගමන් දීමනාව: රු. 10,000.00, සන්නිවේදන දීමනාව: රු. 1,125.00

**පත්වීමේ ස්වභාවය :** EPF සහ ETF හිමිකම් සහිත ස්ථිර පදනම මත.

## 06. සහකාර කළමනාකරු - මානව සම්පත් (විමර්ශන සහ අයකර ගැනීම)

### රැකියා විස්තරය

- කාලෝචිත සහ අපක්ෂපාතී විසඳුම් සහතික කරමින් තොග හිඟය, අලාභ, වංචා, විෂමාචාර සහ අනෙකුත් සේවකයින්ට අදාළ අක්‍රමිකතා පිළිබඳ විමර්ශන පැවැත්වීම සහ සම්බන්ධීකරණය කිරීම.
- සමාගම් ප්‍රතිපත්තිවලට අනුකූලව සේවක වගකීම් නිර්ණය කිරීම, අයකර ගැනීම් සම්බන්ධීකරණය කිරීම සහ නිවැරදි ලේඛන පවත්වා ගැනීම ඇතුළු තොග හිඟය අයකර ගැනීමේ ක්‍රියාවලිය කළමනාකරණය කිරීම.
- සාක්ෂි එක්රැස් කිරීම, විමර්ශන වාර්තා සකස් කිරීම සහ කම්කරු නීති සහ ආයතනික ප්‍රතිපත්තිවලට අනුකූල වීම සහතික කිරීම මගින් විනය සහ අභ්‍යන්තර පරීක්ෂණ ක්‍රියා පටිපාටි සඳහා සහාය වීම.
- කම්කරු නීති හා සමාගම් ප්‍රතිපත්තිවලට අනුකූලව මානව සම්පත් හා නීතිමය ලේඛන සකස් කිරීම සහ සමාලෝචනය කිරීම, යහපත් සේවක සබඳතා පවත්වාගෙන යාම සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා දායක වීම.

**සුදුසුකම් බාහිර අයදුම්කරුවන් සඳහා: පහත 1 හෝ 2**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මානව සම්පත් කළමනාකරණය/ රාජ්‍ය පරිපාලනය/ ව්‍යාපාර පරිපාලනය/ කළමනාකරණය හෝ රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ප්‍රථම උපාධියක්.
2. ඕනෑම පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක මානව සම්පත් කළමනාකරණය පිළිබඳ වෘත්තීය සුදුසුකමක් (අන්තර් මධ්‍ය) සම්පූර්ණ කර තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා (පහත I හෝ II හෝ III):**

I. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.
II. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ MA-4 / MA – 3 කාණ්ඩයේ තනතුරක වසර 5 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
III. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ MA 1-2 කාණ්ඩයේ II ශ්‍රේණියේ තනතුරක වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

- විනය කළමනාකරණය සම්බන්ඳව පෙර පළපරුද්දක් තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ

**වයස :** අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් කේතය සහ පරිමාණය :** (වැටුප් කේතය JM 1-1-2025 සහ වැටුප් පරිමාණය රු. 72,650/= - 10 X රු.1,360/= - 18 X රු.2,040/= - රු.122,970/=)

**වැටුප් සහ අනෙකුත් දීමනා 2026 :** මූලික වැටුප: රු. 65,633.00, ජීවන වියදම් දීමනාව: රු. 17,800.00, ගමන් දීමනාව: රු. 10,000.00, සන්නිවේදන දීමනාව: රු. 1,125.00

**පත්වීමේ ස්වභාවය :** EPF සහ ETF හිමිකම් සහිත ස්ථිර පදනම මත.

**සියලුම අපේක්ෂකයන් සඳහා අදාළ වන පොදු සුදුසුකම්:**

- පිළිගත් වාණිජ හෝ අදාළ ක්ෂේත්‍රයේ (සිල්ලර වෙළඳාම) සමාන තනතුරක පළපුරුද්දක් තිබීම.
- රජයේ ආයතනයක පළපුරුද්ද තිබීම අනිවාර්ය අමතර වාසියක් වනු ඇත.
- විශිෂ්ට විශ්ලේෂණාත්මක, ගැටළු විසඳීමේ සහ සංවිධානාත්මක කුසලතා තිබීම.
- ශක්තිමත් නායකත්ව ගුණාංග සහ අන්තර් පුද්ගල සන්නිවේදන කුසලතා සතු වීම.
- තොරතුරු තාක්ෂණ (IT) කුසලතාව තිබීම.
- විවිධ විෂය පථයන්ට අයත් කණ්ඩායම් මෙහෙයවීමට සහ උපදෙස් දීමට ඇති හැකියාව.

**සෑම අයදුම්කරුවෙකුම:**

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
- තනතුරේ රාජකාරි මැනවින් ඉටු කිරීමට ශාරීරිකව සහ මානසිකව නිරෝගී විය යුතුය.
- විශිෂ්ට සදාචාරාත්මක චරිතයකින් යුක්ත විය යුතුය..

අවශ්‍ය සුදුසුකම්, පළපුරුද්ද සහ නිපුණතා ඇති අපේක්ෂකයින්ට ඔවුන්ගේ ජීව දත්ත පත්‍රිකාව (CV), අදාළ අධ්‍යාපනික සහ වෘත්තීය සහතිකවල පිටපත් සමග ලියාපදිංචි තැපැලෙන් 2026 ජූලි 25 දින හෝ ඊට පෙර "**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මානව සම්පත් සහ පරිපාලන, ලංකා සතොස ලිමිටඩ්, අංක 27, 4 වන මහල, සතොස මහ ලේකම් ගොඩනැගිල්ල, වොක්ෂෝල් වීදිය, කොළඹ 02**" යන ලිපිනයට හෝ නියමිත කාලසීමාව තුළ **vacancies@lankasathosa.org** වෙත විද්‍යුත් තැපැලෙන් යොමු කළ යුතුය.

**සභාපති,**
**ලංකා සතොස ලිමිටඩ්,**
**අංක 27, සතොස මහ ලේකම් ගොඩනැගිල්ල, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.**